# සබරගමු නැටුම් කලාව හා සම්බන්ධ වූ පත්තිනි දේව වන්දනාව

## බන්දුල ලියනගේ

සබරගමු නැටුම් කලාව කුමක්ද යන්නත් ඒ හා බැඳුන පත්තිනි දේව වන්දනාව කෙබඳු එකක් ද යන්නත් සලකා බැලීමට ප්‍රථමයෙන් පත්තිනි දේව වන්දනාව යනු කුමක්දැ යි විමසා බැලීම වටී.

අතීතයේ සිට ශ්‍රී ලාංකිකයන් පුද පූජා පවත්වන දෙවිවරුන් අතර ප්‍රධාන තැනක් පත්තිනි දේව මාතාවන්ට හිමි වෙයි. පත්තිනි දේවියගේ උපන් බිම ශ්‍රී ලංකාව නොවේ. ඇය භාරතීය ප්‍රභවයක් ඇත්තියක් වූවාය. එහෙත් ශ්‍රී ලාංකිකයන් ඇය පෙරුම් පුරන බෝධිසත්ව ගුණෝපේත තැනැත්තියක ලෙසට පිළිගනී. පත්තිනී දේවිය සත් පත්තිනී ලෙසින් ද හඳුන්වනු ලබන්නිය. එයට හේතුව ඇය සත් වාරයක් උපන් හෙයිනි. ගින්නෙන් – මලෙන් – අඹෙන් ආදියෙන් එලෙස සත් වාරයක් උපන් බව සඳහන් වේ. තවත් තැනක පත්තිනි දේවිය, දෙමට මලෙන් – ගිනි කඳෙන් – නයි කඳුලෙන් – විදුලියෙන් – පිනි බිඳුවෙන් – සිහාරැලෙන් – අඹෙන් – සළු පොටෙන් – නුග පත්‍රයෙන් – කදුරු පොත්තෙන් – හෙණයෙන් – ජලයෙන් ආදී අංශ වලින් ද උපත ලැබූ බව සඳහන් වෙයි.[1]

පත්තිනි දේවිය පිළිබඳව ශ්‍රී ලාංකික විශ්වාසය වන්නේ ඇය අඳුන්ගිරි පර්වතයේ හිඳ බුදු බව පතා තවුස් දම්හි යෙදුන බවත් ඇයගේ සිල් බලයෙන් පඬුපුල් අස්න උණුවීමෙන්, දැන ගත් සක් දෙවිඳුන්

---

1 අපේ ජනකලා - කොළඹ පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රකාශනය ජ් පැරකුම් විජේසිංහ ආදීන් සංස්කරණය

ඇයගේ සිල්වත් බව පරීක්ෂා කිරීමට සිතා එහි පැමිණ ඇති බවත් ය. එසේ පැමිණ, "නැගණිය, මට දානයක් දුන මැනව", යි කියා අයදුම් කළ කල්හි, "ඕකත් මට අපූරුවක්" දැයි, කියා අඳුන්ගිරි පර්වතය පයින් මඩ කර සුවඳ ඇල් වී වපුරා එයින් බත් සාදා සක් දෙවිඳුන්ට දුන් බවත්ය.

කෙසේ වුවද පත්තිනි දේවියගේ උපත පිළිබඳව විවිධ අදහස් ඇත. මඩු ශාන්තිකර්මවල දී ගැයෙන පන්තිස් කෝල්මුරවලදී සඳහන් වන්නේ ඇය අඹෙන් උපන් බවය. විවිධ කෝල්මුර කවිවල මෙම උපත විවිධාකාරයෙන් දක්වා ඇත.

වීර කාව්‍යයක් ලෙස සැලකෙන සිලප්පදි කාරම් මහා කාව්‍යයේ පත්තිනි දේවිය පිළිබඳ විස්තර අඩංගු වෙයි. "ඉලංගෝ ආඩියල්" නමැති පඬිවරයෙකු ලියා ඇති මෙම ග්‍රන්ථයෙන් කාන්තාවකගේ පතිවත ආරක්ෂණයේ මහඟු ප්‍රතිඵල විස්තර වෙයි.

මෙහි සඳහන් වන කතා වස්තුව දළ වශයෙන් මෙසේය. වෙළෙඳ කුලයේ උපත ලැබූ කාන්තාවක වූ "කන්නගී" ළාබාල වයසේදී ම කෝවලන් නමැත්තාට විවාහ කර දෙනු ලබයි. එහෙත් කෝවලන් පසුව මාධවී නමැති ගණිකාවක සමඟ බැඳෙයි. එයින් ඔහු සතුව තිබූ ධනය අවසන් වෙයි. ධනය උපයා ගැනීමට කෝවලන් කන්නගීගේ පා සළඹක් ගෙන විකිණීමට මධුරාපුරයට යයි. ඔහු මධුරාපුරයට යන අවස්ථාවේ මධුරාපුරයේ රැජිනගේ පා සළඹක් සොරු අරගෙන රාජ භටයින් එම සොරුන් සොයමින් සිටි අවස්ථාවක කෝවලන් සොරා ලෙසට පිළිගෙන මරුමුවට පත් කරනු ලැබේ. මේ සිදු වූ අපරාධය ගැන කන්නගිය බලවත් කෝපයෙන් මධුරාපුර රජුට හා රැජිනට සාප කරන්නීය. එයින් රජු හා බිසව මරණයට පත් වෙයි. කන්නගිය සිය වම් පයෝධරය සිඳ නගරයට විසි කිරීමෙන් නගරයේ විහාරාරාම ළමුන්, භික්ෂූන් හැර අනෙක් සියල්ල විනාශ වෙයි.

මේ සිලප්පදිකාරම් ග්‍රන්ථයේ අන්තර්ගත කතා වස්තුවයි.

ක්‍රි.ව. 113 දී පමණ රජ පැමිණි ගජබා රජු දවස ශ්‍රී ලංකාවට ගෙන එන ලදැයි සැලකෙන පත්තිනි දේවියගේ ආභරණ මුල්කරගෙන පවත්වන පත්තිනි ඇදහිල්ල පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලාංකික සමාජයට වඩාත් බලපෑ බවට සාක්ෂි ඇත.

ගජබා රජු දවස මෙරටට ගෙනෙන ලදැයි සලකන පත්තිනි දේවිය ගේ ආභරණ වලින්, එක් සළඹක් විල්බාවේ ගල් ලෙනක ද තවත් සළඹක් නවගමු දේවාලයේ ද තවත් පාරිභෝගික භාණ්ඩයක් මැදගොඩ ගල් ගුහාවක ද තබා ඇතැයි විශ්වාස කෙරේ.

පත්තිනි පූජාව සමඟ සිදු කරන ශාන්තිකර්ම අතරේ ගම්මඩුව - පාන් මඩුව - දෙවොල් මඩුව වැදගත් වෙයි. මෙම මඩු ශාන්තිකර්මවල පත්තිනි භාගය නම් කොටසක් ඇත. ඊට අමතරව දෙවොල් භාගය හා වාහල භාගය යන කොටස් ද තිබේ.[2]

පත්තිනි දේවිය ඇදහීම සිංහල සමාජයේ මෙන්ම ද්‍රවිඩ ජන සමාජයේ ද එක ලෙසින් ම පවතී.

භාරතයේ ජන සමාජය බෙදී තිබුණ රජ - බමුණු - වෙළෙඳ - ගොවි යන කුලවලට මෙම ශාන්තිකර්ම වෙන් වූ ස්වරූපයෙන් ම පවත්වා ඇත. මඩු ශාන්තිකර්ම වල දී ඒ ඒ අය වෙනුවෙන් ඉදි කළ යුතු තොරණ් වර්ග ගැන සඳහන් වන්නේ මෙසේය.

---

2 සිංහල දේව පුරාණය - කෝ. එස්. එච්. ධර්මදාස - එම්. එම්. එස්. තුන්දෙණිය ජ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

රජ කුලයට රන් තොරණයි
බමුණු කුලට මිණි තොරණයි
වෙළෙඳ කුලය පට තොරණයි
ගොවි කුලයට රඹ තොරණයි

යාග කරන කාල වශයෙන් ද එය හතර ආකාරයෙකි.

1. රජ කුලයට කරන ලද යාගයක් නම් සත් දින සත් වරුවක් කළ යුතුය.
2. බමුණු කුලයට පස් දින පස් වරුවකි.
3. වෙළඳ කුලයට තුන් දින තුන් වරුවකි.
4. ගොවි කුලයට එක් දින එක් වරුවකි.

සිංහල යාගකරණය සඳහා පත්තිනි දේව වර්ණනා පන්තිස් කෝල්මුර සිංහලයෙන් ගායනය කිරීම ආරම්භ වූයේ පහළොස්වන ශත වර්ශයේ දී පමණය. දඹදිව දී ප්‍රයෝජනයට ගත් සන්න ශ්ලෝක – සංස්කෘත ශ්ලෝක ද දෙවන පැරකුම්බා රජු සමයේ සිට ශ්‍රී ලංකාවට ගැලපෙන ආකාරයෙන් සකසා ගත් ආකාරයත් ගැන සිතන්නට පුළුවන.

පත්තිනි දේවිය සඳහා මෙවන් මඩු ශාන්තිකර්ම පවත්වන්නා සේ ම දැනට පත්තිනි දේවියට පුද පූජා පවත්වන දේවාල ද ශ්‍රී ලංකාවේ දහසකට අධික සංඛ්‍යාවක් ඇත. පත්තිනි දේවියට මඩු ශාන්තිකර්මවල දී ගායනා කරන, පත්තිනි කහදියර කන්නලව්වේ අන්දමට දේවාල හතලිස් අටක් මෙහි ඇති බව කියවේ.

සරම්ප, පැපොල වැනි දෙය්යන්ගෙ ලෙඩ ලෙස ගැමියන් හඳුන්වන බෝවෙන රෝග සඳහා පත්තිනි දේවියගේ ආරක්ෂාව බලාපොරොත්තු වෙයි. අම්මාවරුන්ගේ ලෙඩ යනුවෙන් හඳුන්වන මෙම රෝග සඳහා කිරි අම්මාවරුන්ගේ දානය දීමට භාර හාර වෙති. කිරි අම්මාවරුන්ගේ දානයේ දී

කියවෙන්නේ ද පත්තිනි දෙවියන් ගේ ගුණ වර්ණනාවන් මය.

පත්තිනි දේවිය නමින් පිදුම් කරන ප්‍රධාන දේවාල 16 ක් සබරගමුවේ ඇති බව කියවේ. අරුක්ගොඩ - දඹේමඩ - ගල්කඩුව කුකුළෙගම - වැගම්පිටිය - දහම්ගල - විකිලිය - පල්ලෙවෙල ආදි වශයෙන් එම ස්ථාන සඳහන් වෙයි.

සබරගමු සම්ප්‍රදායේ මඩු ශාන්තිකර්ම පිළිබඳව ගුණ ගැයෙන විශේෂ වූ පන්තිස් කෝල්මුර කවි දක්නට නොලැබේ. පන්තිස් කෝල්මුර කවි සංග්‍රහ සකස් කරන ලද අයගේ එම සංග්‍රහ වල දක්නට ලැබෙන්නේ විවිධාකාරව එකතු කළ කවි ය. ප.බ.ජී. හේවාවසම් මහත්මාගේ, පන්තිස් කෝල්මුර, කවි සංග්‍රහයේ බෞද්ධ මුහුණුවරකින් යුත් කවි රාශියක් එකතු කර ඇති බව පෙනේ.[4]

පූජ්‍ය පරවාහැර සද්ධාජීව හිමි හා ප. බ. ජී. හේවාවසම් යන කතුවරුන් දක්වා ඇති පන්තිස් කෝල්මුර මෙසේය.

1. යහන් සැහැල්ල 2. විසිතුරු කතාව 3. මඩුපුරය 4. පහන් ගැඹුර 5. දං කටිනය 6. පාඩිනලුව 7. අමාරසය 8. පතහ 9. සොළි පුර සාගතය 10. පත්තිනී පැකුම 11. අඹවිදමන 12. හිමාල පර්වත විස්තරය 13. කාවේරි ගඟ දිය කෙළිය 14. කරිකාල් උපත 15. ගඟ බැඳීම 16. දියකෙළි කතාව 17. කෝවිල් පේවීම 18. තුරඟුන් නැඟීම 19. පන්දු කෙළිය 20. ළඳ සරණ දරුදුන් අවවාද (මෙහි නොලැබේ) 21. රුවන් නළුව 22. තපස් හටන 23. මාදේවි කතාව හා වෙසි මඩම 24. දූ කෙළි

---

පන්තිස් කෝල්මුර කවි - සද්ධාජීව හිමි පූජ්‍ය පරවාහැර සහ ප.බ.ජී. හේවාවසම් කොළඹ ප්‍රදීප ප්‍රකාශකයෝ

කතාව 25. වලි නඩය 26. කන්නූරන් කතාව (මෙහි නොලැබේ) 27. ඩේසි මඩම 28. පාළඟ මැරවීම 29. මරා ඉපැද්දවීම 30. විත්තිය 31. සත්පත්තිනි කතාව 32. වැදි පූජාව (මෙහි නොලැබේ) 33. ගජබා කතාව 34. ගනරුව කතාව 35. මෙවන් පාන.

සබරගමු සම්ප්‍රදායේ දි කියවෙන පන්තිස් කෝල්මුර මෙසේය.

1. සත් පත්තිනි කතාව 2. යහන් හැල්ල3. පහන් ගැඹුර 4. සේරමන් මඩුපුරය සහ පාලිමඩුපුරය 5. දත් කටිනය 6. පාඩි නළුව 7. අමා රසය 8. පතහ 9. සොළි පුර සාගතය 10. පත්තිනි පැතුම 11. අඹවිදමන 12. හිමාල වන විස්තරය 13. කාවේරි ගඟ දිය කෙලිය 14. කරි කාල් උපත 15. දිය කෙළි කතාව 16. කෝවිල් පේවීම 17. තුරඟුන් නැහීම 18. සෙන්දූ කෙළිය 19. ළඳුන්ට අවවාද 20. රුවන් නළුව 21. තපස් ගමන 22. මාදේවි කතාව 23. දූකෙළි කතාව 24. වලි නඩය 25. කන්නූරන් කතාව 26. වේසි මඩම 27. පාළඟ මැරීම 28. මරා ඉපැද්දීම 29. විත්ති සත 30. අවවාද විත්තිය 31. වැදි පූජාව 32. අංකොට හටන 33. ගජබා කතාව 34. ගනරුව කතාව 35. ගෙවන් පාන

සබරගමු නැටුම හා සම්බන්ධ (1) හත් දා ගි මඩුව (2) තුන් දා ගිනි මඩුව (3) තුන් දා පහන් මඩුව යන ප්‍රධාන පත්තිනි පූජා විධි ක්‍රමවල මෙසේ පත්තිනි කතාව එක් එක් ආකාරයෙන් විස්තර කර සම්බන්ධ කරගෙන ඇත. පත්තිනි පාලඟ පුරා වෘත්තය පඬි රජුගේ කතා පුවත හා කරිකාලන්, පාඬි සොළි රාජ කතාව යන පුරාවෘත්ත තුන එයට සම්බන්ධ කොට ගෙන ඇත. මෙම පුරා වෘත්ත දෙක හා සම්බන්ධ වූ අනු කතා රාශියක් එකිනෙකට සම්බන්ධ කොට

සම්පූර්ණ කතා පන්තියක් ආබද්ධ කොට ගිං මඩු පුරාණය සකස් වී ඇති බව පෙනේ.

සබරගමු සම්ප්‍රදායේ ශාන්තිකර්මවලට මුල් වූ පත්තිනි දේවාල්වල කපු පරම්පරා පිය – පුතු පරම්පරාවෙන් පැවත ගෙන එයි. මෙම කපු පරම්පරාවලට අනුගමනය කළ යුතු සිරිත් විරිත් රැසක් ඇත. කලින් සඳහන් කළ කරුණුවලට අමතරව එම කපු පරපුරේ අය සිලාදි උසස් ගුණධර්මවල පිහිටිය යුතුය. සම්මතයෙන් ම මෙබඳු අය උසස් යයි සම්මත කුලවලට අයත් අය වෙත්. මෙබඳු කපු තනතුර දරන අය නිතර කිළිවලින් ආරක්‍ෂා විය යුතුය. නිදර්ශනයක් වශයෙන් මරණ කිල්ල – වැදුම් ගෙයි කිල්ල – මාස් කිල්ල වැනි කිළිවලට අසු නොවීමට වග බලා ගත යුතුය. ශාන්තිකර්මවල නිරන්තරයෙන් නියැලිය යුතු මොවුන් කෙම්මුර දිනයන්හි දේවාලයේ මුරුතැන් වැඩීමට හා යාතිකා කිරීමට කටයුතු කළ යුතුය. වර්ෂයකට වරක් වත් – මඩු ශාන්තිකර්මයක් පවත්වා ප්‍රදේශයට ආශිර්වාද ගෙන දිය යුතුය. සම්ප්‍රදාය හා කුලගොත් ආරක්‍ෂණයට යොමු වූ සිදු පරපුරක් ඇති කළ යුතුය. ශාන්තිකර්මවලදී කපු තනතුරට බාර අඹවිදමන – හලං පාවාදිම වැනි අංශ වලට ඉදිරිපත් විය යුතුය.

පූද පූජා කරන කපුවෙකු විශේෂයෙන් සකස් විය යුතු බවට තහංචි කීපයක් ඇත.

1. කපු ඇදුරකුට තමාගේ මවගේ හෝ දරුවකුගේ හෝ මළගමකට වුවද සහභාගී විය නොහැක.
2. නිරන්තරයෙන් පන්සිල් ආරක්‍ෂා කළ යුතුය.
3. සියලු දුශ්චරිතයන්ගෙන් ඈත් විය යුතුය.
4. කපු පරපුරක උපන ලද්දකු විය යුතුය.
5. ශාන්තිකර්මවල දී සියලුම නෘත්‍යාංග පූජා ර්ටාවන්හි නිපුණ විය යුතුය.

6. මනා හැඩරුවකින් යුක්ත විය යුතුය.
7. හිතූ හිතූ ආකාරයට දේවාල ඉදි නොකළ යුතුය.

පත්තිනි දේවාල පවත්වාගෙන එන්නේ මෙම තහංචි හා සිරිත් විරිත් සමඟය. විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණය වන්නේ පත්තිනි දේවියට ඇරුණු කපු පරම්පරා ජීවත්වන්නේ සබරගමුවේ බව ය. එමෙන් ම වැඩි වශයෙන් පත්තිනි දේවාල ඇත්තේ ද සබරගමුවේ ය.

සබරගමු නැටුම සබරගමුවට ආවේණික දෙයක් ලෙසට සඳහන් කළ ද එහි ආරම්භය ගැන සොයා බලන විට එය ජාතික උරුමයක් ලෙස හැඳින්වීම වරදක් නොවේ. උඩරට නැටුම් සම්ප්‍රදායේ වර්ධනයත් සමඟම සාම්ප්‍රදායික නැටුම් ක්‍රමයක් වූ සබරගමු නැටුමේ පසුබෑමක් ඇති වුව ද එය සබරගමුවෙන් ඈත්වීමක් සිදුවූයේ නැත. කලින් සඳහන් කළ පරිදි උසස් යයි සම්මත කුලවලට පමණක් සීමා වී තිබුණ මෙම ජාතික නැටුම් ක්‍රමය ගෙන ආවේ කපු නිළමෙවරුන් වීම නිසා වෙනත් කිසිවෙකුට සබරගමු නැටුම් කලාව හැදෑරීමට අවස්ථාවක් නොවීය. දේව ශාන්ති – ග්‍රහ ශාන්තියක තොවිල් වශයෙන් කොටස් තුනකට වර්ග කර ඇති ජාතික නර්තන අංශ වලින් දේව ශාන්ති ගණයේ නැටුම් ක්‍රම උසස් පූජාමය ශාන්තිකර්මයක් ලෙසට පිළිගැනීමක් තිබුණි. මේ අදහස ඇති කළේ ද කපු නිළමෙවරුන්මය. මෙම කපු නිළමේවරුන් දෙවියන්ට ආවතේව කරන පිරිසක් බවට පිළිගෙන තිබීමත් විශේෂයෙන් ම පත්තිනි දෙවියන් සඳහා ඇප කැප වූ පිරිසක් ලෙසට පිළිගෙන තිබීමත් මේ තත්වයට හේතු වන්නට ඇත.

කෙසේ වුවද සබරගමු නැටුම් සම්ප්‍රදායේදි පත්තිනි දේවිය වෙනුවෙන් වඩා කියවෙන්නේ පත්තිනි පාළඟ කතා පුවත බව පෙනේ. මෙම කතා පුවතට

සම්බන්ධව පත්තිනි විවාහය - පාළඟ දුරාචාරයට නැඹුරුවීම - සම්පත් විනාශවීම - සළඹ විකිණීමට යාම - පඬි රජුන් ගේ උදහසට ළඟාවීම - පාළඟ මැරවීම - මදුරුමාල යක්ෂණිය දමනය - පාළඟ ඉපැද්දවීම - මදුරාපුරය ගිනිබත් කිරීම හා සුවපත් කිරීම - මැදුරුමාල පත්තිනි උපත හා අලුත් පත්තිනි කතාව වැනි විස්තර මෙවැනි ශාන්තිකර්මවල දි කියවෙයි.

දෙවොල් භාගය හා දෙවොල් යාදින්නට අනුව මඩුපුරය හා අඹවිදමන යන කෝල්මුරවලින් කියවෙන්නේ මියගිය පාළඟ කුමරු දෙවොල් දෙවියන් වශයෙන් ඉපිද පත්තිනි දේවිය සමඟ එක යහනේ පුද පඩුරු ලැබීමට වරම් ගන්නා අන්දමය.

මදුරාපුරයට ගිය පාළඟ කුමරුගේ මරණය සිදු වූ අන්දම ද පාළඟ කුමරු සොයා ගිය පත්තිනි දේවිය ගේ ක්‍රියා කලාපය ද දිගින් දිගට විස්තර වෙයි. මඩු ශාන්තිකර්මවල දි මේ එකින් එක විස්තර වෙයි.

මඩු ශාන්තිකර්ම උඩරට හා පහතරට නැටුම් සම්ප්‍රදායන්හි ද ඇත. මඩු ශාන්තිකර්ම පුරාණය ගැන සඳහන්** වන කවියක් මෙසේය.

පළමුව කන්නුම් පුර ගී මඩු උපතක් සෑදුනා
දෙවනුව පඩුවස් නිරිඳුට වන් දිවි දොස් දුර හරිනා
තෙවනුව සේරමන් රජු හට එලෙසම ගි මඩු කරනා
එදා පටන් නරලොව ගම්මඩු පිළිවෙල සෑදුනා

උඩරට සම්ප්‍රදායේ මඩු ශාන්තිකර්මවල තරමක් වෙනසක් දක්නට ලැබුණ ද පහතරට හා සබරගමු මඩු ශාන්තිකර්මවල එතරම් වෙනසක් දක්නට නොලැබේ.